සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 8 ශ්‍රේණිය
## බුද්ධ ධර්මය I

**නම/විභාග අංකය :-- ..............................................................................** **කාලය : පැය 02 යි.**

1 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතුරෙන් නිවැරදි හෝ වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.

1. සීලයෙන් සමාධියෙන් ප්‍රඥාවෙන් ලොව දෙව් මිනිසුන් අතර අග්‍ර වන්නේ,

1.මහා බ්‍රහ්මයා ය 2. බුදු රජාණන් වහන්සේ ය 3. දෙව්දත් තෙර ය 4. වසවර්ති මාරයා ය

2. බුදු රජාණන් වහන්සේ මල්ල රට අනුපිය නම් අඹ වනයට වැඩම කළ අවස්ථාවේ පැවිද්ද ලබාගත් තෙරවරුන්ට අයත් නොවන්නේ,

1. භද්දිය 2. ආනන්ද 3. දේවදත්ත 4. නන්ද

3. දෙව්දත් තෙර සංඝ භේදයක් ඇති කිරීමට කළ කටයුත්ත නම්,

1. බුදු රජාණන් වහන්සේ මැරවීමට කුමන්ත්‍රණ කිරීම
2. නාලාගිරි ඇතාට රා පොවා බුදුරදුන් ඉදිරියට එවීම
3. බුදුරදුන්ගෙන් වර පහක් ඉල්ලා සිටීම
4. ගිජ්ජකුට පර්වතයට නැගී බුදුරදුන්ට ගලක් පෙරලීම

4. උපසම්පදාවෙන් වස් සියයක් ඉක්ම වූ මෙහෙණියක් වුව ද එදිනම උපසම්පදාව ලද භික්ෂුව දැක වැඳිය යුතුය. ගරු කළ යුතුය. මෙම කරුණ අයත් වන්නේ,

1. අෂ්ටලෝක ධර්ම වලට ය 2. අෂ්ට ගරු ධර්ම වලට ය
3. අට මහ කුසල් වලට ය 4. අරි අටගි මගට ය

5. සිදුහත් කුමාරයාගේ සොහොයුරාද, සුද්ධෝදන රජුගේ හා මහා ප්‍රජාපතී ගෝතමී දේවියගේ ද පුතා වන්නේ,

1. නන්ද කුමරු 2. ආනන්ද කුමරු
3. ආලවක කුමරු 4. නාලක කුමරු

6. ''ස්වාමීනී, අපි යම් කථාවකින් උනිමු නම් ඒවා භාග්‍යවතුන් වහන්සේට පසු වත් ඇසීමට දුර්ලභ නොවේ. ඔබ වහන්සේගේ අරුත්බර දේශනාව කරන්න.'' යනුවෙන් බුදුරදුන්ට ප්‍රකාශ කළේ,

1. සෝණදණ්ඩ බමුණා ය 2. සකුළුදායී පිරිවැජියා ය
3. සුභද්‍ර පිරිවැජියා ය 4. සුදත්ත සිටුවරයා ය

7. බුදු රජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාගේ පරිහරණය පිණිස විහාර වර්ග පහක් අනුමත කළේ,

1. රජගහ නුවර සිටුවරයාගේ ඉල්ලීම පරිදි ය 2. පිය රජතුමාගේ ඉල්ලීම පරිදි ය
3. තම අභිමතය පරිදි ය 4. කොසොල් මහ රජතුමාගේ ඉල්ලීම පරිදි ය

8. අප භාවිතා කරන ඉතිපිසෝ, ස්වාක්ඛාතෝ, සුපටිපන්නෝ යන ගාථාවන්හි ඇතුළත් ගුණ ගණන

1. 20 කි  2. 15 කි  3. 18 කි  4. 24 කි

9. සිදුහත් බෝසතාණෝ බුදු වූයේ,

1. අවුරුදු 29 දී ය  2. අවුරුදු 35 දී ය
3. අවුරුදු 55 දී ය  4. අවුරුදු 16 දී ය

10. ධර්මය ප්‍රගුණ කරන්නාට කල් නොයවාම ධර්මයේ ප්‍රතිඵල ලැබෙන බැවින් ධර්මය,

1. ස්වාක්ඛාත නම් වේ  2. සන්දිට්ඨික නම් වේ
3. අකාලික නම් වේ  4. ඒහිපස්සික නම් වේ

11. පැරණි සිරිත් අනුව ගණ දෙවියන්ට හා සරස්වතී දේවියට පූජා වට්ටියක් තබා දේවාශිර්වාද ලබා ඉටුකරන උත්සවය වන්නේ,

1. උපන්දින උත්සවයයි  2. අත්පොත් තැබීමේ උත්සවයයි
3. සරණ මංගල්‍ය උත්සවයයි  4. ගෘහ ප්‍රවේශ මංගල්‍යයයි

12. ''කිරිකඩ හේල'' නමින් හඳුන්වන්නේ,

1. උස ගසකි  2. කිරි ගසකි
3. වස්ත්‍රයකි  4. කිරි මිශ්‍ර ආහාරයකි

13. තමන්ට නිසි මග පෙන්වා දුන් ගුරුවරයා සිටි දිශාවට දිනකට තෙවරක් නමස්කාර කළේ,

1. අස්සජි මහ රහතන් වහන්සේ ය  2. සැරියුත් මහ රහතන් වහන්සේ ය
3. මුගලන් මහ රහතන් වහන්සේ ය  4. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ය

14. අෂ්ටාංග ශීලය සමාදන්වීමේ දී මහා සයන පාවිච්චි කළ නොහැක. මෙම මහා සයන වලට අයත් වන්නේ,

1. මධ්‍යම පුරුෂයෙකුගේ රියනට වඩා උස් පා ඇති ඇඳ ය
2. මධ්‍යම පුරුෂයෙකුගේ රියනට වඩා උස් පා ඇති පුටු ය
3. රබර්, කුෂන් හා ස්ප්‍රින් යොදා සැකසූ අධික සැප සහිත ආසන ය
4. සිල් සමාදන් වන විට බිමට අතුරණ පැදුරු, ඉටිකොළ වැනි දෑය

15. කොසොල් රට මහ රජතුමාගේ පුරෝහිත තනතුරේ සිටි භග්ග නම් බමුණාට දාව මන්තාණි නම් බැමිණියට උපන් පුත් කුමරා වූයේ,

1. මට්ටකුණ්ඩලී ය  2. දේවදත්ත ය  3. නන්ද ය  4. අහිංසක ය

16. මහනෙල් සුවඳ මය

...... පිළි ගඳ මය මෙම පද්‍යයේ හිස්තැනට ගැළපෙන පිළිතුර වන්නේ,

1. තල් මසු යන්නය  2. කුඩ මසු යන්නය
3. ඉරමුසු යන්නය  4. රන්මසු යන්නය

17. අප අඳින ඇඳුම තෝරා ගැනීමේ දී,

1. එහි ඇති මෝස්තරය ගැන සලකා බැලිය යුතුය
2. අපගේ හැදියාව, සංස්කෘතිය හා තත්ත්වය පිළිබඳ සලකා බැලිය යුතුය
3. කය නිරාවරණය වන ඇඳුම් තෝරාගත යුතුය
4. කීප දෙනෙකුට පාවිච්චි කළ හැකි එකක් ද යන්න සලකා බැලිය යුතුය

18. අයිතිකරුට නොපෙනෙන සේ නො දැනෙන සේ යමක් ගැනීම,

1. ප්‍රාණඝාතයයි
2. සුරාමේරයයි
3. අදත්තාදානයයි
4. මුසුවාදයයි

19. විදේශීය ආක්‍රමණිකයෙක් වූ එළාර රජු පැරදවූ දුටුගැමුණු රජතුමා එළාර රජු වෙනුවෙන් සොහොනක් කරවා ගරු කිරීමෙන් පෙන්නුම් කළේ ශ්‍රී ලාංකිකයන්ගේ,

1. පරිත්‍යාගශීලීත්වයයි
2. විශේෂත්වයයි
3. සහජීවනයයි
4. ආගන්තුක සත්කාරයයි

20. සිංහල ජාතිය නමැති ළදරුවා හැදී වැඩී පෝෂණය වූ තොටිල්ල ලෙස හඳුන්වන්නේ,

1. බුදු දහමය
2. බ්‍රාහ්මණ දහමය
3. ඉස්ලාම් දහමය
4. කිතු දහමයි

(2 x 20 = 40)

## II කොටස

● **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

1. i. බුදුගුණ සිහිකර වඩනු ලබන භාවනාව නම් කරන්න.
   ii. එම භාවනාව වැඩීමේ ආනිශංස දෙකක් ලියන්න.
   iii. බුදුරදුන් කියා දුන් තෙරුවන් ගුණ ඇතුළත් ගාථා තුනක් සිහිපත් කරමින් මහ මග ගමන් කරන විට සොරු කණ්ඩායමක් විසින් මරා දැමුණු තරුණයා සහ ඔහුගේ ගුරුවරයාගේ නම් පිළිවෙලින් ලියන්න.
   iv. භාවනා වඩන විට පිරිමි දරුවන් සහ ගැහැණු දරුවන් වාඩි වී සිටිය යුතු ඉරියව් පිළිවෙලින් ලියන්න.
   v. අරහං බුදු ගුණය හඳුන්වන්න. (4 x 5 = 20)

2. i. බුදු රජාණන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේලාගේ ප්‍රසාදජනක පැවැත්ම සඳහා පෙන්වා දී ඇති ආචාර ධර්ම පද්ධතිය හඳුන්වන්නේ කෙසේද? (ලකුණු 02)
   ii. ඇඳුම් ඇඳීමේ පරමාර්ථ කීපයක් බුද්ධ දේශනාවේ පෙන්වා දී ඇත. ඉන් දෙකක් ලියන්න. (ලකුණු 03)
   iii. ලංකාවේ මාර්ග අනතුරු හේතුවෙන් දිනකට පුද්ගලයෝ 8ක් පමණ මිය යති. මෙවැනි අනතුරු හා මරණ වළක්වා ගැනීමට ගත හැකි පියවර විස්තර කරන්න. (ලකුණු 05)

3. i. සීලයේ ප්‍රභේද දෙකක් නම් කරන්න. (ලකුණු 02)
   ii. අෂ්ටාංග ශීලයේ එන පළමු සිල්පද තුන පිළිවෙලින් ලියන්න. (ලකුණු 03)
   iii. පන්සිල්වල පළමු සිල්පදය කඩ කරන අවස්ථා විස්තර කරන්න. (ලකුණු 05)

4. i. යස්ස පාපං කතං කම්මං ...... ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)
   ii. එම ගාථාවේ අදහස ලියන්න. (ලකුණු 03)
   iii. කුඩා අවධියේ සිට දෙමාපිය, ගුරුවරු හා වැඩිහිටි අයගේ අවවාද අනුශාසනා පිළිපැදීමේ වටිනාකම විස්තර කරන්න. (ලකුණු 05)

5. i. සිගාලෝවාද සූත්‍රයට අනුව, බටහිර හා උතුර යන දිසා දෙකට අයත් සමාජ කණ්ඩායම් දෙක පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)
   ii. ස්වාමියා විසින් භාර්යාවට ඉටු කළ යුතු යුතුකම් (සාරධර්ම) 3 ක් නම් කරන්න. (ලකුණු 03)
   iii. ඉහත ii. සඳහන් කළ එක් යුතුකමක් ස්වාමියා විසින් බිරිඳට ඉටු කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

6. i. තමා බුදු දහම අගය කරන්නේ එමගින් කිසිවකු හිංසාවට පීඩාවට පත් නොකරන නිසා යැයි පැවසූ බටහිර දාර්ශනිකයා නම් කරන්න. (ලකුණු 02)
   ii. මිහිඳු මහ රහතන් වහන්සේ විසින් මෙරටට හඳුන්වා දුන් බුදු දහම නිසා ශ්‍රී ලාංකීය බෞද්ධයන්ගේ දක්නට ලැබුණු උසස් මානව ගුණාංග 3 ක් ලියන්න. (ලකුණු 03)
   iii. බුදු සිරිතෙන් පෙන්වා දෙන ආගමික සහනශීලී ගුණය බෞද්ධ ජන සමාජයේ ද දක්නට ඇති අවස්ථා හඳුන්වන්න. (ලකුණු 05)

7. පහත මාතෘකා දෙකකට කෙටි සටහන් ලියන්න. (එක් කොටසකට ලකුණු 05 කි.)

   i. දණ්ඩක ප්‍රශ්නය
   ii. මුගලන් මහ රහතන් වහන්සේ
   iii. බුදුගුණ
   iv. අවමංගල්‍ය චාරිත්‍ර

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 8 ශ්‍රේණිය
## බුද්ධ ධර්මය

### පිළිතුරු පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. - 2 | 2. - 4 | 3. - 3 | 4. - 2 | 5. - 1 | 6. - 2 | 7. - 1 | 8. - 4 |
| 9. - 2 | 10. - 3 | 11. - 2 | 12. - 3 | 13. - 2 | 14. - 3 | 15. - 4 | 16. - 2 |
| 17. - 2 | 18. - 3 | 19. - 3 | 20. - 1 | | | | |

### II කොටස

1. i. බුද්ධානුස්සති භාවනාව
   ii. බුදුරදුන් පිළිබඳ අසීමිත පැහැදීම, පාපයට ලජ්ජාව හා බිය ඇතිවීම, රාග, ද්වේෂ, මෝහ සිතිවිලි යටපත් වීම... (34 පිටුව)
   iii. ඡත්ත මාණවක, පොක්ඛරසාති බමුණු පඩිවරයා
   iv. පිරිමි - බද්ධ පර්යංකය
   ගැහැණු - අර්ධ පර්යංකය
   v. බුදු රජාණන් වහන්සේ සියලු කෙලෙස් දුරුකළ නිසාත්
   සියලු පාපයන්ගෙන් මිදුණු නිසාත්
   සියලු ලෝ වැසියන්ගේ ආමිස පූජා, ප්‍රතිපත්ති පූජා පිළිගැනීමට සුදුසු වූ බැවින් අරහං නම් වේ.
   (කරුණු 1 - ලකුණු 1, කරුණු 2 - ලකුණු 2, කරුණු 3 - ලකුණු 4)
2. i. සේඛියා ධර්ම
   ii. නොවැසුණහොත් ලැජ්ජා ඇතිවන තැන් වසා ගැනීම.
   මැසි මදුරු උවදුරුවලින් ආරක්ෂා වීම.
   අව්ව, වැස්ස, සුළඟ ආදියෙන් වන විපත්වලින් ආරක්ෂා වීම.
   iii. මාර්ග අනතුරු සඳහා ප්‍රධාන වශයෙන් හේතු වන්නේ නොසැලකිලිමත් කමයි. මෙය පාරේ ගමන් කරන පදිකයන්ගේ ද වාහන රියදුරන්ගේ ද දක්නට ඇත. සමහර පදිකයන් මාර්ග නීති නොතකයි. සුදු ඉරෙන් පාර මාරුවීමට නොසිතයි. දුම්රිය ගේට්ටු ද තිබියදී ද ඉන් රිංගා යාමට කටයුතු කරයි. පාර පුරා ගමන් කරයි. අනෙකුත් වාහන හා ජනතාව ගැන හෝ විදුලි සංඥා ගැන නොතකයි. එම නිසා අනතුරු සිදුවේ.
   රථවාහන රියදුරන් ද බීමත්ව රිය පැදවීම, මාර්ග සංඥා නොතැකීම, වාහන ධාවනය කරන විට දුරකථනය පාවිච්චි කිරීම වැනි නීති විරෝධී ක්‍රියා සිදු කරයි. මේවා වළක්වා ගැනීම පිණිස පදිකයන්ද රථවාහන රියදුරන්ද නීතිගරුකව විනය ගරුකව, ඉවසීමෙන් කටයුතු කළ යුතුව ඇත. රියදුරෙක් නම් අවශ්‍ය කරන නින්ද ලබාගැනීම, මාර්ග සංඥා ගැන සැලකීම, බීමත්ව රිය ධාවනය නොකිරීම ඉතා වැදගත් වේ.
3. i. පන්සිල්, අටසිල්, දස සිල්, ආජීව අෂ්ටමක සිල්
   ii. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි
   අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
   අබ්‍රහ්ම චරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි
   iii. ජීවත්ව සිටින විශාල හෝ කුඩා සතුන්ගේ ප්‍රාණය නිරුද්ධ කිරීම.
   සතුන්ට නොයෙකුත් අයුරින් හිංසා කිරීම.
   අනුන් ලවා සතුන් මැරවීම.
   බිත්තරයක පිළිසිඳ සිටින සත්ත්වයෙකුගේ ජීවිතය විනාශ කිරීම.
   රථවාහන වලට යටකර මරා දැමීම.
   ගිනි තබා මරා දැමීම, උගුල් ඇටවීම.
   වස විස කවා විනාශ කිරීම.
   හිතාමතා වැරදි ඖෂධ දී මැරවීම.
   මරාගෙන මැරෙන බෝම්බ කරුවන් යොදා ජීවිත විනාශ කිරීම.
   මෙවැනි කරුණු 5 ක් ඇත්නම් උපරිම ලකුණු දෙන්න.
4. i. යස්ස පාපං කතං කම්මං - කුසලේන පිථීයති
   සෝ ඉමං ලෝකං පභාසේති - අබ්භා මුත්තෝව චන්දිමා
   ii. යමෙකු විසින් කරන ලද පාප කර්මය ඔහු විසින්ම කරන ලද කුසල කර්මයෙන් වැසී යයි ද එම තැනැත්තා වලා

ගැබෙන් මිදුණු පුන් සඳ මෙන් මේ ලෝකය බබළවයි.

iii. කුඩා අවධියේ දී හැම දරුවෙක්ම දෙමාපිය, ගුරු, වැඩිහිටි යන අයගේ අවවාද අනුශාසනා ලබයි. එසේ ලැබෙන අවවාද අනුශාසනා කරදරයක් යැයි නොසිතා එය තමාගේ අඩුපාඩු හඳාගැනීමට නිධානයක් පෙන්වා දීමක් යැයි කල්පනා කොට බාර ගත යුතුය. හැම කෙනෙකුගේ ම වැරදි අඩුපාඩු ඕනෑතරම් තිබිය හැක. එබැවින් තමාගේ ජීවිතය ගොඩනගා ගැනීමට ඉහත කී අයගේ අවවාද අනුශාසනා හොඳින් අසා දැනගෙන ඒ අනුව ක්‍රියා කළ යුතුය. එවිට ඔහු වළා ගැබෙන් මිදුණු පුන්සඳක් මෙන් මුලු ලෝකයටම ආලෝකය ලබා දේ.

(මෙවැනි කරුණුහෝ ගැළපෙන කරුණු සහිත පිළිතුරු වලට උපරිම ලකුණු දෙන්න.)

5. i. ස්වාමියා, බිරිඳ හා හිතමිතුරු සම්බන්ධය
   ii. සම්මාන කිරීම, අවමන් නොකිරීම, වෙනත් කාන්තාවන් කරා නොයෑම, වගකීම් පවරා දීම, ඇඳුම් පැළඳුම් ලබාදීම
   iii. පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න (71, 72 පිටු)

6. i. බර්ට්‍රන්ඩ් රසල්
   ii. පරෝපකාරය, අවිහිංසාව, ආගන්තුක සත්කාරය, සහයෝගයෙන් ජීවත්වීම, අන්මත ගරු කිරීම, චාම් බව, සරල බව
   iii. බුදු රජාණන් වහන්සේ තුළ ආගමික සහනශීලීතාවය ඉතා උසස් වශයෙන් දක්නට ලැබුණි. ඒ අනුව ශ්‍රී ලාංකික බෞද්ධ ජන සමාජයේ ද ආගමික සහනශීලීතාවට අදාළ කරුණු ගොඩනැගුණි. මේවා අතර විවිධ ජාතීන් සමඟ සහජීවනයෙන් ක්‍රියා කිරීම, පරිත්‍යාගශීලීබව, අරියවංශ ධර්ම දේශනා සඳහා සියල්ලෝම සහභාගීවීම, පින්තාලි තැබීම හා අම්බලම් තැනීම, පන්සල තුළ දේවාල ඉදිකිරීමට අවස්ථාව දීම, දළදා මැදුර වැඳ පුදා ගැනීමෙන් පසු සතර මහා දේවාල වැඳ පුරාගැනීම, ශ්‍රී පාදස්ථානය විවිධ ජන කොටස් එකමුතුකමින් වන්දනා කිරීම, වෙසක්, නත්තල්, දීපවාලි, රාමසාන් වැනි උත්සව භේදයකින් තොරව සැමරීම වැනි උදාහරණ 5 ඇත්නම් උපරිම ලකුණු දෙන්න.

7. i. දණ්ඩක ප්‍රශ්නය - මහෞෂධ කුමාරයාගේ ප්‍රඥාව විමසා බැලීම සඳහා රජතුමා භාවිතා කළ උපක්‍රමයකි දණ්ඩක ප්‍රශ්නය. කිහිරි ගසක දඬු කැබැල්ලක් ගෙන එහි පොත්ත ඉවත් කොට අග මුල සොයා ගැනීමට නොහැකි වන පරිදි සකසා එම දණ්ඩ යව මැදුම් ගමට යවා අග මුල සොයාදෙන ලෙස ගම්වාසීන්ට පැවරුණි. එය කළ නොහැකි නම් දහසක දඩයක් ගසන බව ද රජතුමා දන්වා යැවීය. ගම්වාසීන්ට මෙය සොයා ගැනීමට බැරි වූ නිසා මහෞෂධ කුමාරයාට පවරන ලදී. ඒ සඳහා දිය බඳුනක් හා නූලක් භාවිතා කොට ගැටලුව විසඳීය. පසුව කිහිරි දණ්ඩේ අගමුල නිවැරදිව තෝරා රජතුමාට දන්වා යැවූ පසු රජතුමා බොහෝ සතුටට පත්වුණි.
   ii. මුගලන් මහ රහතන් වහන්සේ - දඹදිව රජගහ නුවර සමීපයෙහි තිබුණු උපතිස්ස ගමට ආසන්නව තිබූ බමුණු ගම වූයේ කෝලිත නම් ගමයි. එහි මහාසාර බමුණු කුලයෙහි උපන් මොග්ගල්ලාන බැමිණියගේ පුත්‍රයා කෝලිත නම් විය. මොහුගේ මිත්‍රයා වූ උපතිස්ස සමග ''ගිරග්ගසමජ්ජ'' නම් සැණකෙළියට සහභාගිව එහි නිරර්ථක බව දැනගෙන විමුක්තිය සොයා යාමට තීරණය කළහ. පළමුව සංජය පිරිවැජියා ළග පැවිදිව සිට අනතුරුව අස්සජි මහ රහතන් වහන්සේ මගින් උපතිස්ස උගත් දහම දැනගෙන කෝලිය පිරිවැජියා සෝවාන් විය.
   පසුව බුදු රදුන් මුණ ගැසී කෝලිත පිරිවැජියා මොග්ගල්ලා නමින් පැවිදි වුණි. අගසව් තනතුර පතා පෙරුම් පිරූ බැවින් මුගලන් මහරහතන් වහන්සේට අගසව් තනතුර හිමිවුණි. එසේම මුගලන් තෙරණුවෝ ඍද්ධිමතුන් අතරින් අග්‍රස්ථානයට ද පත්කළ සේක. ඍද්ධි බලය යොදාගෙන බොහෝ ශාසනික සේවාවන් ඉටු කළ මුගලන් මහ රහතන් වහන්සේ කිසි විටෙකත් එය අනිසි ලෙස භාවිත නොකළේ ය. මුගලන් හිමියන්ගේ වෑයම නිසා බොහෝ පිරිස් සසුන්ගත වුණි. මෙයට වෛරයෙන් සිටි අන්‍ය තීර්ථකයෝ උන්වහන්සේ ඝාතනයටය කුමන්ත්‍රණ කළහ. දෙවරක් ඉන් බේරුනත් තෙවැනි වර පෙර අත් භවයක කළ පාප කර්මයක විපාක අත්විඳින්නට සිදුවන බව දැනගත් බැවින් සොරු උන්වහන්සේට තලා පෙළා මළහ යි සිතා ඉන් පිටත්ව ගියහ. පසුව ඍද්ධි බලයෙන් නැගී සිටි මුගලන් හිමියෝ බුදු හිමි වෙත එළඹ වැඳ අවසර ගෙන කාලසිලාවට වැඩ පිරිනිවන් පෑහ.
   iii. බුදුගුණ - නව අරහාදී බුදු ගුණ (ගුණ 9) පිළිවෙලින් ලියා තිබීම ප්‍රමාණවත්ය.

| | | | |
|---|---|---|---|
| ගුණ 1 - 2 | ලකුණු 0 | ගුණ 3 - 4 | ලකුණු 2 |
| ගුණ 5 - 6 | ලකුණු 4 | ගුණ 7 - 9 | ලකුණු 5 |

   iv. අවමංගල්‍ය චාරිත්‍ර - අවමංගල්‍යක් සිදු වූ නිවසක අවමංගල්‍ය සිදු වුන දා සිට දේහය මිහිදන් කිරීම තෙක් ඉටුකරන චාරිත්‍ර මාලාව මීට අයත් වේ. ඒ අනුව,
   නිවස ඉදිරිපිට සුදු කොඩි එල්ලා තැබීම, නිවසේ පින්තූර කනපිට හරවා තැබීම.
   සුදු ඇඳුමින් සැරසී පැමිණීම, රාත්‍රී කාලයේ සතිපට්ඨාන සූත්‍රය හෝ වෙස්සන්තර ජාතකය කීම.
   පන්සලේ ස්ථවිර වහන්සේ විසින් මතක වස්ත්‍ර පූජා කිරීම.
   ගිහි පැවිදි ගුණ කථා පැවැත්වීම.
   දාන, ශීල, භාවනා ලෙස රැස් කළ පින් මියගිය අයට අනුමෝදන් කිරීමට පැන් වැඩීම.
   සරලව, චාම්ව දේහය සුසාන භූමිය කරා රැගෙනයාම.
   දින 5 න් හෝ 7 න් ධර්ම දේශනාවක් පැවැත්වීම